ඇමුණුම 02 (14)


# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ED/4/58/8/1/4/DOE (ii)
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2023.03.

.....................................................

ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණිය

**සම්මුඛ පරීක්ෂණ අංකය :**

මහත්මයාණෙනි / මහත්මියනි,

**<u>අධ්‍යාපන අමාත්‍යාංශයේ හා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල අධ්‍යාපන අධ්‍යක්ෂ / කොමසාරිස් තනතුරු සඳහා පත් කිරීමේ සම්මුඛ පරීක්ෂණය</u>**

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථානුකූලව එම සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් අතරින්, අධ්‍යාපන අමාත්‍යාංශයේ හා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල පුරප්පාඩුව පවතින අධ්‍යාපන අධ්‍යක්ෂ / කොමසාරිස් තනතුරු වලට සුදුසු නිලධාරීන් පත්කිරීමට පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණය 2023 මාර්තු / අප්‍රේල් මස .......... දින පෙ.ව. / ප.ව. .................ට බත්තරමුල්ල, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ දී පැවැත්වේ. එදිනට අධ්‍යාපන ලේකම් කාර්යාල කමිටු ශාලා පරිශ්‍රයට (3 වන මහල) පැමිණෙන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

02. එදිනට පහත සඳහන් ලිපි ලේඛන වල මුල් පිටපත් හා එම ලේඛනයන්හි සහතික කරන ලද ඡායා පිටපත් පහත අංක i සිට xxi දක්වා වූ අංක අනුපිළිවෙලට වෙන වෙනම ලිපි ගොනු දෙකක් ලෙස අමුණා ඔබගේ නම හා සම්මුඛ පරීක්ෂණ අංකය ගොනුව ඉදිරියෙහි සඳහන් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.

i. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් ලිපිය
ii. ජාතික හැඳුනුම්පත / විදේශ ගමන් බලපත්‍රය
iii. උප්පැන්න සහතිකය
iv. ඉදිරිපත් කරනු ලබන සහතිකයන්හි නමෙහි වෙනසක් පවතී නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක්
v. මුල් පත්වීම් ලිපිය
vi. පත්වීම ස්ථිර කිරීමේ ලිපිය
vii. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියට උසස් කිරීමේ ලිපිය
viii. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I පන්තියට /ශ්‍රේණියට උසස් කිරීමේ ලිපිය
ix. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I පන්තියේ / ශ්‍රේණියේ වැඩ භාරගැනීමේ ලිපිය
x. I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සාමාර්ථය ලැබූ බවට හෝ එයින් නිදහස් කළ බවට නිකුත් කළ ලිපිය
xi. ඉහත x සාමාර්ථයට හෝ නිදහස් කිරීමට අදාළ පශ්චාත් උපාධි / පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකය
xii. II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සාමාර්ථය ලැබූ බවට හෝ ඒවායින් නිදහස් කළ බවට නිකුත් කළ ලිපිය
xiii. ඉහත xii සාමාර්ථයට හෝ නිදහස් කිරීමට අදාළ පශ්චාත් උපාධි / පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකය
xiv. I වන හෝ II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයන්ගෙන් සාමාර්ථය ලැබූ බවට හෝ එයින් නිදහස් කිරීමට අදාළ සහතික හැර සම්පූර්ණ කර ඇති වෙනත් පශ්චාත් උපාධි සහතික
xv. I වන හෝ II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයන්ගෙන් සාමාර්ථය ලැබූ බවට හෝ එයින් නිදහස් කිරීමට අදාළ සහතික හැර සම්පූර්ණ කර ඇති වෙනත් පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතික
xvi. ඉහත xiv හා xv හැර සම්පූර්ණ කර ඇති වෙනත් අධ්‍යාපන සහතික (දර්ශනපති, දර්ශනශූරී ආදී)



Scanned with MOBILE SCANNER

xvii. සේවා සහතිකය (ශ්‍රී ලං.අ.ප.සේවයට බඳවා ගත් දින සිට අයදුම්පත් කැඳවන අවසාන දින දක්වා දැරූ තනතුරු හා එක් එක් තනතුර දැරූ කාලපරිච්ඡේද වෙන වෙනම පෞද්ගලික ලිපි ගොනුව ආශ්‍රිතව ලබා ගත යුතුය)

xviii. ඉහත අංක xiv හා xv හි සඳහන් පශ්චාත් උපාධියට / පශ්චාත් උපාධි ඩිප්ලෝමාවට ඉදිරිපත් කරන ලද නිබන්ධනයට අදාළ වූ පර්යේෂණ නිබන්ධන හැර ලකුණු පටිපාටියේ 3.1 නිර්ණායකයට යටතට අයත් වන වෙනත් පර්යේෂණ නිබන්ධන (එක් එක් පර්යේෂණ නිබන්ධනයේ මාතෘකාව සහිත පිටුවෙහි, පර්යේෂණය කුමක්ද යන්න පැහැදිලිව දක්වා ඇති පිටුවෙහි, පර්යේෂක ලෙස ඔබගේ නම සඳහන් වන පිටුවෙහි, අදාළ විශ්වවිද්‍යාලයේ / ආයතනයේ නම සඳහන් පිටුවෙහි ඡායා පිටපතක් ගොනුවට ඇමිණිය යුතු අතර පර්යේෂණ නිබන්ධන සම්මුඛ පරීක්ෂණයට රැගෙන ආ යුතුය)

xix. පෙළපොත් හා ඒ ආශ්‍රිත පරිශීලන ග්‍රන්ථ හැර අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශන මණ්ඩලය මගින් අනුමත ප්‍රකාශන (මාතෘකාව සහිත පිටුවෙහි, ප්‍රකාශනය කුමක් අරඹයාද යන්න පැහැදිලිව දක්වා ඇති පිටුවෙහි, කතෘ / ප්‍රකාශක ලෙස ඔබගේ නම සඳහන් වන පිටුවෙහි, අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශන මණ්ඩලය මගින් අනුමත බව සඳහන් පිටුවෙහි ඡායා පිටපත් ගොනුවට ඇමිණිය යුතු අතර ප්‍රකාශන සම්මුඛ පරීක්ෂණයට රැගෙන ආ යුතුය)

xx. අධ්‍යාපන ප්‍රකාශන සඳහා ලබා දෙන ලද වාර්තා සහ ශාස්ත්‍රීය සංග්‍රහ ( මාතෘකාව සහිත පිටුවෙහි, ප්‍රකාශනය කුමක් අරඹයාද යන්න පැහැදිලිව දක්වා ඇති පිටුවෙහි, කතෘ / ප්‍රකාශක ලෙස ඔබගේ නම සඳහන් වන පිටුවෙහි ඡායා පිටපත් ගොනුවට ඇමිණිය යුතු අතර වාර්තා සහ ශාස්ත්‍රීය සංග්‍රහ සම්මුඛ පරීක්ෂණයට රැගෙන ආ යුතුය)

xxi. ලකුණු පටිපාටියේ අංක 07අනුව ඉදිරිපත් කිරීමට අදාළ දෘඪ පිටපත. (පිටපතක් ගොනුවට ඇමිණිය යුතුය)

03. ඉහත සම්මුඛ පරීක්ෂණය සඳහා 2022.11.28 දින අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කරන ලද නිවේදනය සමඟ වූ ලකුණු පටිපාටිය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ ලේකම් විසින් යොමු කරන ලද අංක ESC/APP/SLEAS/04/02/2023 හා 2023.01.13 දින දරණ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් යොමු කරන ලද අංක PSC/EST/6/2/34/1/2012–2 වෙළුම හා 2023.02.10 දින දරණ ලිපි අනුව නැවත සංශෝධනය කරන ලද අතර එම ලකුණු පටිපාටිය 2023.02.20 දින අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කර ඇත. 2023.02.20 දින වෙබ් අඩවියේ පළ කරන ලද සංශෝධිත ලකුණු පටිපාටියට අනුකූලව මෙම සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් වෙත ලකුණු ලබා දීම සිදු කෙරේ.

04. මෙම සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමම පමණක් අධ්‍යාපන අධ්‍යක්ෂ / කොමසාරිස් තනතුරකට පත්වීම් ලැබීම සඳහා හිමිකමක් නොවන බව ද, දැනට පුරප්පාඩු වී ඇති අධ්‍යාපන අධ්‍යක්ෂ / කොමසාරිස් තනතුරු සියල්ල සඳහාම නිලධාරීන් පත්කිරීමේ හෝ තනතුරු කිහිපයක් සඳහා පමණක් නිලධාරීන් පත්කිරීමේ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව සතු වන බව ද, වැඩිදුරටත් අවධාරණය කරමි.

05. නියමිත දින මෙම සම්මුඛ පරීක්ෂණයට සහභාගී නොවන්නේ නම් ඒ සඳහා වෙනත් දිනයක් ලබා නොදෙන හෙයින් එවැනි ඉල්ලීම් සලකා බලනු නොලබන බවද, අදාළ ලිපිලේඛන සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන අවස්ථාවේදී අනිවාර්යයෙන්ම ඉදිරිපත් කල යුතු බවද කාරුණිකව දන්වමි.

06. සම්මුඛ පරීක්ෂණයට සහභාගීවීම වෙනුවෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

අත්.කළේ :- එම්.එන්. රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

ආචාර්ය අයි.එම්.කේ.බී. ඉලංගසිංහ
අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන) - රා.ආ.



Scanned with MOBILE SCANNER